යමෙකුට නැරඹීමට අසීරු ආකාරයේ සංවේදී ඡායාරූප පුවත්පතක පළ කිරීම, බොහෝ විට යම් පාඨක පිරිසකට අපහසුතාවයක් ගෙන දීමේ ඉඩක් තිබේ. කෙසේ නමුත් ඇතැම් විට මාධ්‍යයක පළ කෙරෙනා ඇතැම් ඡායාරූප කිසිසේත්ම පළ නොකළ යුතු ඒවා බව කිව යුතුයි. දිවයින පුවත්පතේ (05/06) "ඇප අරන් එළියට ඇවිත් ඇපත් නැතිව අවසන් ගමන් ගිය රියාඩ්" යන සිරස්තලයෙන් යුතු විශේෂාංග ලිපිය සමගින් පළ කොට ඇති විශාල ප්‍රමාණයේ ඡායාරූපය ඊට නිදසුනකි. "කපා කොටා දැමූ රියාඩ්ගේ සිරුර" යන මාතෘකාව සමග පළව තිබූ මෙම ඡායාරූපයේ නැරඹීමට අපහසු ලෙසින් හානි වූ මළ සිරුරක් දක්නට ලැබිණි.
ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන්හිද දැක්වේ.
මෙවැනි නැරඹීමට අපහසු තරමේ සංවේදී ඡායාරූපයක් පළ නොකිරීම මගින් ලිපියේ අන්තර්ගතයට හෝ ඉන් ඉදිරිපත් කරනා කාරණයට හානියක් වේද? එසේ හානියක් නොවන්නේ නම්, මෙවැනි සංවේදී ඡායාරූපයක් මෙම ලිපිය හා පළ කිරීම අවශ්‍යද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #Divaina